ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 ඔක්තෝබර් මස 29 වන දින |

## කො.පා.මි.ද මත පදනම් වූ උද්ධමනය 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 4හි නොවෙනස්ව පැවතුණි

**මතුපිට උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 4.0%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.6%
මාසික වෙනස : 0.1%

**මූලික උද්ධමනය**

වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය : 3.0%
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.4%
මාසික වෙනස : 0.1%







කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 4.0හි නොවෙනස්ව පැවති අතර, 2019 ඔක්තෝබර් මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු විය. මේ අතර, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 11.5හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 10.0 දක්වා පහළ ගිය නමුත්, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 0.9හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 1.3 දක්වා ඉහළ ගියේය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන කො.පා.මි දර්ශකයෙහි වෙනස 2020 සැප්තැම්බර් මාසයේ පැවති සියයට 4.7හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 4.6 දක්වා සුළු වශයෙන් පහළ ගියේය.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

2020 ඔක්තෝබර් මාසයේ දී කො.පා.මි. දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.1ක් ලෙස වාර්තා විය. ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2020 ඔක්තෝබර් මාසයේ දී ආහාර කාණ්ඩයෙහි ලොකු ළූණු, සහල් සහ කහ කුඩු මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, පළතුරු, කුකුල් මස් සහ බිත්තර මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2020 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 2.9හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.0 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. එසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 සැප්තැම්බර් මාසයේ දී පැවති සියයට 3.6හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී සියයට 3.4 දක්වා පහළ ගියේය.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 01 : කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 122.8 | 125.6 | -0.1 | 0.6 | 5.8 | 3.5 | 6.6 | 5.6 |
| | පෙබරවාරි | 121.9 | 125.8 | -0.7 | 0.2 | 4.5 | 3.5 | 6.4 | 5.3 |
| | මාර්තු | 121.4 | 125.9 | -0.4 | 0.1 | 4.2 | 3.4 | 6.1 | 5.0 |
| | අප්‍රේල් | 121.5 | 126.2 | 0.1 | 0.2 | 3.8 | 3.5 | 5.9 | 4.7 |
| | මැයි | 122.9 | 126.4 | 1.2 | 0.2 | 4.0 | 3.2 | 5.7 | 4.5 |
| | ජූනි | 125.4 | 127.0 | 2.0 | 0.5 | 4.4 | 3.4 | 5.6 | 4.4 |
| | ජූලි | 125.8 | 127.3 | 0.3 | 0.2 | 5.4 | 3.9 | 5.6 | 4.3 |
| | අගෝස්තු | 125.8 | 127.5 | 0.0 | 0.2 | 5.9 | 3.7 | 5.6 | 4.1 |
| | සැප්තැම්බර් | 124.9 | 128.0 | -0.7 | 0.4 | 4.3 | 3.8 | 5.4 | 3.9 |
| | ඔක්තෝබර් | 124.6 | 128.1 | -0.2 | 0.1 | 3.1 | 3.8 | 5.0 | 3.8 |
| | නොවැම්බර් | 126.2 | 128.9 | 1.3 | 0.6 | 3.3 | 3.4 | 4.6 | 3.6 |
| | දෙසැම්බර් | 126.3 | 128.8 | 0.1 | -0.1 | 2.8 | 3.1 | 4.3 | 3.5 |
| 2019 | ජනවාරි | 127.4 | 132.5 | 0.9 | 2.9 | 3.7 | 5.5 | 4.1 | 3.7 |
| | පෙබරවාරි | 126.8 | 132.6 | -0.5 | 0.1 | 4.0 | 5.4 | 4.1 | 3.8 |
| | මාර්තු | 126.6 | 133.0 | -0.2 | 0.3 | 4.3 | 5.6 | 4.1 | 4.0 |
| | අප්‍රේල් | 127.0 | 133.1 | 0.3 | 0.1 | 4.5 | 5.5 | 4.1 | 4.2 |
| | මැයි | 129.0 | 134.2 | 1.6 | 0.8 | 5.0 | 6.2 | 4.2 | 4.4 |
| | ජූනි | 130.2 | 134.4 | 0.9 | 0.1 | 3.8 | 5.8 | 4.2 | 4.7 |
| | ජූලි | 130.0 | 134.6 | -0.2 | 0.1 | 3.3 | 5.7 | 4.0 | 4.8 |
| | අගෝස්තු | 130.1 | 134.6 | 0.1 | 0.0 | 3.4 | 5.6 | 3.8 | 5.0 |
| | සැප්තැම්බර් | 131.1 | 135.2 | 0.8 | 0.4 | 5.0 | 5.6 | 3.9 | 5.1 |
| | ඔක්තෝබර් | 131.3 | 135.2 | 0.2 | 0.0 | 5.4 | 5.5 | 4.0 | 5.3 |
| | නොවැම්බර් | 131.7 | 135.5 | 0.3 | 0.2 | 4.4 | 5.1 | 4.1 | 5.4 |
| | දෙසැම්බර් | 132.4 | 135.0 | 0.5 | -0.4 | 4.8 | 4.8 | 4.3 | 5.5 |
| 2020 | ජනවාරි | 134.6 | 136.5 | 1.7 | 1.1 | 5.7 | 3.0 | 4.5 | 5.3 |
| | පෙබරවාරි | 134.6 | 136.9 | 0.0 | 0.3 | 6.2 | 3.2 | 4.6 | 5.1 |
| | මාර්තු | 133.4 | 136.9 | -0.9 | 0.0 | 5.4 | 2.9 | 4.7 | 4.9 |
| | අප්‍රේල් | 133.6 | 137.2 | 0.1 | 0.2 | 5.2 | 3.1 | 4.8 | 4.7 |
| | මැයි | 134.2 | 138.1 | 0.4 | 0.7 | 4.0 | 2.9 | 4.7 | 4.4 |
| | ජූනි | 135.3 | 138.6 | 0.8 | 0.4 | 3.9 | 3.1 | 4.7 | 4.2 |
| | ජූලි | 135.4 | 138.9 | 0.1 | 0.2 | 4.2 | 3.2 | 4.8 | 4.0 |
| | අගෝස්තු | 135.4 | 138.9 | 0.0 | 0.0 | 4.1 | 3.2 | 4.8 | 3.8 |
| | සැප්තැම්බර් | 136.3 | 139.1 | 0.7 | 0.1 | 4.0 | 2.9 | 4.7 | 3.6 |
| | ඔක්තෝබර් | 136.5 | 139.2 | 0.1 | 0.1 | 4.0 | 3.0 | 4.6 | 3.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව